## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
## 2022.01.28

පැමිණීම - පැමිණීමේ ලේඛණය පරිදි වේ.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපති හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2022.01.28 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිතුමන් සහ මැති ඇමතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර 2021වර්ෂයේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ගැටළු සාකච්ඡා කිරීම මෙන්ම 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය මෙම කමිටුව මඟින් සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි. වෙනත් වසරවලට සාපේක්ෂව මෙම වසරේ ප්‍රතිපාදන ලබා දීම වෙනස් ස්වරූපයක් ගන්නා බවත්, එහිදී, සියලුම ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන අතර වියදම් කිරීම කාර්තුමය වශයෙන් සිදුවන බව දැනුම් දෙන ලදි. ඒ අනුව, ලැබී ඇති රුපියල් මිලියන 3200ක ප්‍රතිපාදන සඳහා අවශ්‍ය යෝජනා සාර්ථක කර ගැනීමට අවශ්‍ය සහාය සියලුම දේශපාලන අධිකාරිය හා රාජ්‍ය නිලධාරීන් විසින් ලබාදීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් අතර, ව්‍යාපෘති ක්‍රියාත්මත කිරීම පෙබරවාරි මස 03 වන දින සිදුවන බවත් ඒ සඳහා ද සියලුම පාර්ශවයන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් පවතින ගැටළු විසඳාගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ප්‍රධානම රාජ්‍ය නිලධාරීන්ගේ රැස්වීම වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දෙමින් සහ එහි උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස සිහි කරමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.
සාකච්ඡාවේදී ගනු ලබන තීරණ වාර්තාවේ සඳහන් කරන අතර, අදාල නිලධාරීන් විසින් එම තීරණ ක්‍රියාත්මක කර ප්‍රගතිය ඉදිරිපත් කිරීම අනිවාර්ය වන බව ප්‍රකාශ කල අතර පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් වාර්තා නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලදි. අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **පසුගිය රැස්වීමේ දී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය** | | | |
| 1.1 | සීමා නිර්ණය කමිටුව වෙත නව යෝජනා ඉදිරිපත් කිරීම | ග්‍රාම සේවා වසම් 12ක් සඳහා පමණක් ඒකාබද්ධ යෝජනා ලැබී ඇති බවත් වෙන්කිරීමේ යෝජනා ද ලැබී ඇති බවත් වාර්තා විය. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) / අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 1.2 | ඕකෙවෙල පොලිස් ස්ථානය ස්ථාපිත කිරීමේ දී මතු වී ඇතිගැටළු හා නව පොලිස් ස්ථානය ස්ථාපිත කිරීමේ දී ඇතිවන ගැටළු | විහාරස්ථානයකට අයත් මෙම භූමිය පවරා ගැනීමේ යෝජනාව මේ වන තෙක් පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර නොමැති බවත්, පොලිස් ස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇති නමුත් ඉඩම මේ වන තෙක් පවරා ගෙන නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | අදාල ආයතනයේ ඉල්ලීමකින් තොරව අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක නොවන බැවින් ඉඩම අත්පත් කර ගැනීමට අදාල ඉල්ලීම පොලීසිය විසින් කඩිනමින් අදාල අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල / ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.3 | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021 | මුලු නිෂ්පාදන ගම්මාන 28ක ප්‍රතිලාභීන් 1793ක් සඳහා රු.මි. 83.36ක් අනුමත වූ අතර, ප්‍රතිලාභී දායකත්වය රු.මි. 111.61ක් බවට වාර්තා විය. තව ද, නිෂ්පාදන ගම්මානවල ක්‍රියාත්මක අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති ගණන 66ක් වූ අතර සඳහා අනුමත මුදල රු.මි. 84ක් බවත් වාර්තා විය. බෙලිඅත්ත හා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ව්‍යාපෘති 2ක් පමණක් වැඩ අවසන් කිරීමට නොහැකි වූ බවට කරුනු දක්වන ලදි. | අවසන් කිරීමට නොහැකි වූ වැඩ කොටස් මෙම වසරේ දී නිම කිරීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 1.4 | විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 සඳහා අනුමත ව්‍යාපෘති 958ක් සඳහා මුළු ප්‍රතිපාදන රු.මි. 70.81ක් වන අතර සියලු ව්‍යාපෘති වැඩ අවසන් කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | 2022 වර්ෂයට අදාල යෝජනා කඩිනමින් ලබා දීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 1.5 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන | ක්‍රීඩාපිටි 12ක් සඳහා අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. 20.1ක් වන අතර, එමගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර වියදම රු.මි.19.44ක් බවට වාර්තා විය. | 2022 වර්ෂයේ ද ග්‍රාමීය ක්‍රීඩාපිටි සඳහා මුදල් වෙන් කරන බව දන්වන ලදි | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 1.6 | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | වැව් 12ක සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇති බවත්, ඉතිරිය මෙම වසරේ අවසන් කිරීමට කටයුතු කරන බවත් දන්වන ලදි.<br>මෙම වසර සඳහා වැව් 46ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිත බව හා මෙම කාර්තුවේ දී වැව් 22ක් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බවදන්වන ලදි. | ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය |
| 1.7 | හුස්මදෙන තුරු රුක් රෝපන වැඩසටහන | ඕකෙවෙල, තංගල්ල, බෙලිඅත්ත හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අඹ පැල 3500ක්, දොඩම් පැල 3500ක් හා දෙහි පැල 3500ක් රෝපනය කිරීම සිදු කර ඇති බවට වාර්තා විය. | | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 1.8 | සුරකිමු ගංගා ජාතික වැඩසටහන | ලුණුගම්වෙහෙර හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ව්‍යාපෘති 3ක් සඳහා අනුමත ප්‍රතිපාදන රු.මි. 16.71කින් වියදම රු.මි. 10.18ක් බවට වාර්තා විය.<br>වළවේ ගඟ සංවර්ධන කටයුතුවලට අදාලව ගොඩවාය දක්වා සුද්දකිරීම් කටයුතු අවසන් කර ඇති බවත්, ඉතිරි කොටස ඉවත් කිරීමට අධික | අගෝස්තු මාසය වන විට අවසන්කළ හැකි වන ලෙස වාරි මාර්ග අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය ලේකම් එකඟතාවයකින් යුතුව ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වර්සාව හා උඩවලව දොරටු විවෘත කිරීම නිසා නොහැකි වූ බව වාර්තා විය. කිරිදි ඔය පවිත්‍ර කිරීමේ කටයුතු අධික වර්සාව හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව වාර්තා විය.<br>මෙම වැඩසටහන සඳහා මිලියන 200ක් පමණ වෙන් වන අතර, එම ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා සුදුසු ක්‍රම වේදයක් සකස් කර ගත යුතු බවට කරුණු ඉදිරිපත් විය. ඒ අනුව ප්‍රාදේශීය<br>ලේකම් මගින් ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කිරීමේ හැකියාව පිළිබඳව කරුණු විමසන ලදි. | | |
| 1.9 | හ/යටාලතිස්ස ප්‍රාථමික විද්‍යාලයේ සිසු දරුවන් හ/දෙබරවැව ජාතික පාසලේ 06 ශ්‍රේණියට ඇතුළත් කිරීමේ ගැටළුව | පන්ති කාමර සංඛ්‍යාව වැඩි කළ ද ඉඩ පහසුකම් පිළිබඳ ගැටළුවක් පවතින බවත් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා කමිටුවක් පත්කර ඇති බවත් දන්වන ලදි. | අදාල කමිටුව ගරු සම සභාපති උපුල් ගලප්පත්ති මැතිතුමා සමඟ සාකච්ඡාවක් පවත්වන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 1.10 | කටුවන ෆයිනස් වගාව ඉවත් කිරීමේ දී දැව ප්‍රවාහනය සඳහා මාර්ග භාවිතය සම්බන්ධයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම | ෆයිනස් ශාක ඉවත් කිරීමේ දී දැව ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා නොදුන් බව දැන්වීමෙන් අනතුරුව 2021.12.21 දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් එකඟ වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. 2022.01.13 දිනැති ලිපිය මගින් එකී අනුමැතිය ලබා දී ඇති බව කටුවන ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් දන්වන ලදි. | ගරු සභාපතිතුමන් ද එකඟ වී ඇති බැවින් ෆයිනස් වගාව ඉවත් කිරීම සඳහා මාර්ග භාවිතයට අනුමැතිය ලබා දීමට තීරණය විය. තව ද, විවිධ හේතු දක්වමින් කාර්ය පමාකිරීමකින් තොරව සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. එමෙන් ම වන සතුන් ගම් වැදීම වැළැක්වීම අරමුණු කරගෙන කොස්, දෙල්, දූරියන්, අඹ වැනි දේශීය පලතුරු ශාක වගා කරන ලෙස ද, හොර ශාකය වගා කරන ප්‍රමාණය අඩු කරන ලෙස ද දන්වන ලදි. වගා කරන ශාක පිළිබඳ විස්තරයක් මීළඟ රැස්වීමට වාර්තා කරන ලෙස ද උපදෙස් ලබා දුනි. | සභාපති - කටුවන ප්‍රාදේශීය සභාව / දිසා වන නිලධාරී / ප්‍රාදේශීය කළමනාකරු- රාජ්‍ය දැව සංස්ථාව |
| 1.11 | ගව පාලනය සඳහා තෘණභූමි වෙන් කිරීම | අමර වැව ආශ්‍රිතව වෙන් කර ඇති භූමිය සම්බන්ධයෙන් ශේෂ්‍යාධිකරණ තීන්දුවක් පවතින බැවින් වෙනත් කටයුත්තක් සඳහා එම භූමිය වෙන් කර ගැනීමේ අපහසුතාවයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ශේෂ්‍යාධිකරණ තීන්දුව සම්බන්ධ සියලු තොරතුරු මීළඟ රැස්වීමට ඉදිරිපත් කරන ලෙස හා ප්‍රාදේශීය ලේකම්, සහකාර අධ්‍යක්ෂ වනජීවී දකුණ සා දිසාවන නිලධාරී සමඟ | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කඩවර වැව ආශ්‍රිතව වෙන් කර ඇති භූමියේ කැළෑව අතින් ඉවත්කරන ලෙස දන්වා ඇති අතර, එය ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් වන නිසා එම කටයුතු නතර වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | සාකච්ඡාවක් මීළඟ කමිටුවට පෙර පවත්වා වාර්තාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර සබරගමු පළාත් වන නිලධාරී මීළඟ කමිටුවට කැඳවන ලෙස දන්වන ලදි. | ලුණුගම්වෙහෙර / ඉඩම් පරිහරණ නිලධාරී / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ / දිසා වන නිලධාරී |
| 1.12 | අම්බලන්තොට වී අලෙවි මණ්ඩලයේ නිල නිවාසයන් හි දීර්ඝ කාලයක් සිට පදිංචිව සිටින අය සඳහා එහි නීත්‍යානුකූල අයිතිය ලබා දෙන ලෙස ඉල්ලීම | ඉඩමක් නොමැති අයෙකුට අයිතිය ලබා දීමට තීරණය කිරීමේ දී එම පුද්ගලයාට හිමි ඉඩම් පිළිබඳව තහවුරු කර ගැනීම අවශ්‍ය වන බැවින් එම අනවසර පදිංචිකරුවන්ට හිමි වෙනත් ඉඩම් පිළිබඳ තොරතුරු සොයමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ඒ සම්බන්ධ කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස්ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට /ප්‍රාදේශීය කළමනාකරු - වී අලෙවි මණ්ඩලය |
| 1.13 | කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා මිද්දෙනිය තැපැල් ස්ථානය ස්ථාපිත කර ඇති ස්තානයෙන් කොටසක් ලබා ගැනීම | මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කරරන ලද බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - කටුවන ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - කටුවන / තැපැල් ස්ථානාධිපති |
| 1.14 | විශේෂ කාර්ය බලකාය නව ගොවිපලක් ආරම්භ කිරීම සඳහා සුදුසු ඉඩමක් ඉල්ලීම | ව්‍යාපෘති වාර්තාවක් ලබා දීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලීසිය) / දිස්ත්‍රික් ඉඩම් පරිහරණ නිලධාරී |
| 1.15 | ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලැබී ඇති පොහොර නැවත ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම | ගොවීන් සඳහා රසායනික පොහොර ලබානොදෙන බැවින් පවතින පොහොර වී පර්යේෂණ ආයතනය වැනි රාජ්‍ය ආයතන සඳහා බෙදා දීමට කටයුතු කරන බවට කරුණු දක්වන ලදි.<br>ගොවීන් විසින් පෙර කන්නවල ඉතිරි කරගත් රසායනික පොහොර මෙම කන්නයේ දී භාවිතා කර ඇති බවට තොරතුරු ලැබෙන බව වාර්තා විය. | පොහොර භාවිතය හා අස්වනු සම්බන්ධ වාර්තා යැවීමේ දී සත්‍ය තොරතුරු ඇතුලත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම / සහකාර අධ්‍යක්ෂ (පොහොර) |
| **02** | **සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය** | | | |
| 2.1 | සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකාබද්ධ | කටුවන, බෙලිඅත්ත, තංගල්ල හා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ව්‍යාපෘති 5ක් සඳහා රු.මි. 22.91ක ප්‍රතිපාදන වෙන් වූ අතර, වියදම රු.මි. 19.08ක් හා | අතැති බිල් සඳහා කඩිනමින් ප්‍රතිපාදන ගෙන්වා ගැනීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | වැඩසටහන 2021 | අතැති බිල්පත් වටිනාක රු.මි. 0.84ක් වන බව වාර්තා විය. | | |
| 2.2 | කිතුල් කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2021 | අම්බලන්තොට, කටුවන, වලස්මුල්ල කොට්ඨාසවල ව්‍යාපෘති 03ක් සඳහා රු.මි. 2.00ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන වියදම් කර අවසන් බවට කරුණු ඉදිරිපත් විය. | | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.3 | විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 2021 | ජාතික උරුම ප්‍රාසංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු , කරාබුනැටි, බුලත් කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්තහා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති 04ක් සඳහා රු.මි. 9.99ක ප්‍රතිපාදනවලින් රු.මි. 9.38ක් වියදම් කර ඇති බවට වාර්තා විය. | | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.4 | විදුලිවැට මාර්ග ශුද්ධ කිරීමේ ව්‍යාපෘතිය 2021 | සූරියවැව, හම්බන්තොට, තිස්සමහාරාමය හා ලුණුගම්වෙහෙර ව්‍යාපෘති 11ක් සඳහා අනුමත ප්‍රතිපාදන රු.මි. 7.12කින් රු.මි. 1.83ක් වියදම් කර ඇති බවට වාර්තා විය. | මායිම් තීරණය කිරීමේ ගැටළු හේතුවෙන් විදුලි වැට සකස් කිරීම ප්‍රමාද වීම නිසා අදාල පාර්ශව එකතු වී මේ පිළිබඳ කඩිනම් තීර ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.5 | හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය තුලින් පරිසර සංරක්ෂණ වැඩසටහන 2021 | ප්‍රතිලාභීන් 72ක් සඳහා අනුමත රු.මි. 10.93කින් රු.මි. 7.46ක් වියදම් කර ඇති අතර, අතැති බිල්පත් වටිනාකම රු.මි. 14.8ක් බවට වාර්තා විය. 2021.12.31දිනට ලැබුනු ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වියදම් කිරීමට නොහැකි වී ඇති බවද දැනුම් දෙන ලදි. | අතැති බිල් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කඩිනමින් ලබා ගැනීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| **03** | **2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්** | | | |
| 3.1 | ගම සමඟ පිළිසඳර 2022 - | ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ මිලියන 3200ක ප්‍රතිපාදන මේ වන විටත් ලැබී ඇත. ඒ අනුව, එක් වසමකට රු.මි. 3 බැගින් වසම් 576 සඳහා රු.මි. 1728ක් ද, එක් කොට්ඨාසයකට රු.මි.4 බැඟින් පළාත් පාලන කොට්ඨාස 153 සඳහා රු.මි.612ක් ද, එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රු.මි.15 බැඟින් මන්ත්‍රීවරුන් 7 සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන ඔස්සේ රු.මි. 105ක් ද, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ආයෝජනය වෙනුවෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ යෝජනා සඳහා (රු.මි.100) හා උපසභාපතිවරුන්ගේ යෝජනා | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මෙම යෝජනා ක්‍රියාත්මක කරන අතර, සියලුම දෙපාර්තමේන්තු හා ආයතනවල සහාය එම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ලබා දෙන ලෙස දන්වන ලදි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | (රු.මි. 20) යෝජනා සඳහා රු.මි. 755ක් ද මේ වසර සඳහා වෙන් වී ඇති බවට වාර්තා විය.<br>තව ද මෙම වැඩසටහන මඟින් 2022.02.03 දින පෙ.ව 8.52ට දිවයින පුරා වැඩ ලක්ෂයක් ආරම්භ කිරීමට ඇති අතර, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති 4032ක් එදිනට ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත. ව්‍යාපෘති තෝරා ගැනීමේ දී ජීවනෝපාය සංවර්ධනය සඳහා අවමය 40%ක් ද, පොදු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උපරිමය 40%ක් ද, පරිසර හා තිරසර සංවර්ධනය සඳහා 10%ක් ද, සමාජ සුභසාධනය හා සමාජ සංවර්ධනය සඳහා 10%ක් ද වශයෙන් තෝරාගත යුතු බවත්, සියල්ල එක්ව සැලකූ විට ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා අවම වශයෙන් 40%ක් වෙන් කළ යුතු බවත්, උපරිම සීමාවක් නොසලකා ජාතික හා ප්‍රාදේශීය අවශ්‍යතාවය හා නිෂ්පාදන ඵලදායීතාවය මත ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් සඳහා අවහය ප්‍රතිපාදන වෙන් කළ හැකි බවත් දන්වන ලදි. ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ දී නිශ්චිතව හඳුනාගත් ව්‍යාපෘති පමණක් ඉදිරිපත් විය යුතු අතර, ව්‍යාපෘති වාර්තා අවශ්‍ය අවස්ථාවලදී ලබා දිය යුතු බවත්, කාර්තුමය වශයෙන් මුදල් වියදම් කළ යුතු බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදි. | ව්‍යාපෘති හඳුනාගැනීමේ දී ගැටළු ඇති නොවන පරිදි දේශපාලන අධිකාරිය හා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධීකරණය වී ඉදිරි කටයුතු කරන ලෙසත්, ව්‍යාපෘති වෙනස් කිරීමේ දී සාකච්ඡා කර අදාල වෙනස් කිරීම් සිදු කරන ලෙසත්, පළමු කාර්තුවේ වැඩ මාර්තු මස වන විට අවසන් කර ගෙවීම් ද කළ යුතු බව දන්වන ලදි. | |
| 3.2 | විමධ්‍යගත අයවැය වැඩසටහන 2022 | අනුමත රු.මි. 105න් පළමු කාර්තුව සඳහා රු.මි.21ක් වෙන් වන අතර ගරු මන්ත්‍රීවරුන් විසින් 2022.01.30 වන විට යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර අවසන් කළ යුතු බවත්, මිලදී ගැනීම් සඳහා උපරිමය හා ඉදිකිරීම් සඳහා අවමය රු.මි. 7.5 විය යුතු බවත් දන්වන ලදි. | අදාල ප්‍රතිපාදන වියදම් කිරීමට අවශ්‍ය වැඩසටහන් කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 3.3 | ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2022 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ග්‍රාමීය ක්‍රීඩාංගනයක් සඳහා රු.මි. 2ක් වෙන් වන අතර, 2022.02.10 දිනට ප්‍රථම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | එකඟතාවයෙන් යුතුව ව්‍යාපෘති තෝරාගෙන ශක්‍යතා වාර්තා සහ විධිමත් ඇස්තමේන්තු සමඟ අමාත්‍යාංශයට යොමු කළ යුතු බවත්, සියලුම ව්‍යාපෘතීන්හි සංවර්ධන කටයුතු 2022.05.30 දිනට අවසන් කළ යුතු බවටත් ප්‍රකාශ කරන ලදි. ඊට අදාල තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යවා ඇති බවට වාර්තා විය. | | |
| 3.4 | යෝජිත ගෘහාශ්‍රිත වෙළඳ ඒකක **(Home Shop)** ව්‍යාපෘතිය | ග්‍රාමීය කමිටුවේ හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව ග්‍රාම නිලධාරී වසමකින් එක් කාන්තා ව්‍යාවසායකයකු තෝරා ගත යුතු අතර එම ව්‍යවසායකයා අවුරුදු 50ට අඩු පරිගනක සාක්ෂරතාවයේ මූලික කුසලතාවයක් තිබීම හෝ පුහුණුවකින් කුසලතාවය අත්පත් කර ගත හැකි අයෙකු විය යුතු අතර සතියේ දින 7 තුළම පැය 12කට වැඩි කාලයක් වෙළඳසැල විවෘතව තැබිය හැකි විය යුතු බව දන්වන ලදි. | තෝරා ගැනීම් කටයුතු කඩිනම් කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| **04** | **පරිසර ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 4.1 | තංගල්ල නගරයේ කසල ඉවත් නොකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | තංගල්ල නගරයේ කැළි කසල ඉවත් කිරීම නගරසභාව විසින් සිදු නොකරන බැවින් නගරය පුරා අප්‍රසන්නතාවයක් මතු වී ඇති බවත්, ඩෙංගු රෝග ව්‍යාප්තියට වැඩි අවධානමක් පවතින බවත් දන්වන ලදි.<br>නගරසභාවේ තනතුරු පත් කිරීම සම්බන්ධයෙන් නඩු කටයුත්තක් ක්‍රියාත්මක වන බැවින් ඉන්දන නිකුත් කිරීම සිදු නොවන නිසා කැළි කසල ඉවත් කිරීමේ කාර්ය අක්‍රිය වී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | පවතින ගැටළු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන් සමඟ සාකච්ඡා කර මුදල් වියදම් කිරීමට අවශ්‍ය විධිවිධාන සලසන ලෙස උපදෙස් ලබා දුනි. | පළාත් පාලන සහකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **05** | **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 5.1 | කොරෝනා ව්‍යාප්තියේ වර්තමාන තත්වය එන්නත් ලබා දීමේ ප්‍රගතිය හා වර්තමාන ගැටළු | ශ්‍රී ලංකාව එන්නත්කරණයේ ඉහලින්ම සිටින බව දන්වන ලදි. ඒ අනුව පළමු මාත්‍රාව 92.57% ක් ද, දෙවන මාත්‍රාව 87%ක් ද, තෙවන මාත්‍රාව 32%ක් ද වශයෙන් එන්නත් කිරීම් කර ඇති බවත්, තරුණ පිරිස් 3 වන මාත්‍රාව (Booster) ගැනීමේ අඩු ප්‍රවනතාවයක් පවතින බවත් වාර්තා විය.<br>රෝගය පැතිරීමේ අවදානම අඩු වී නොමැති අතර Rapid Test Kit හිඟතාවය හේතුවෙන් වාර්තා වීම අඩු වී ඇති බැවින් සියලුදෙනා එන්නත්කරණයට ලක්විය යුතු බවත්,ඒකරාශී වීම් සීමා කර ස්වයං පාලනයක් තුලින් පැතිරීම අඩු කර ගත හැකි බවත් දන්වන ලදි.<br>දිස්ත්‍රික්කය පුරා එන්නත්කරණ කටයුතු හා අනෙකුත් කාර්යයන් වෙනුවෙන් ආරක්ෂක අංශ ඇතුළු සියලුම පාර්ශවයන් දැක්වූ සහාය සම්බන්ධයෙන් කෘතඥ වන බව ද ප්‍රකාශ කරන ලද අතර ඒ වෙනුවෙන් විශේෂ වැඩසටහනක් 2022.01.29 දින දිවයින පුරා ක්‍රියාත්මක වන බව ද දන්වන ලදි. | සියලු පාර්ශවයන් සඳහා එන්නත්කරණය සිදු කරන ලෙසත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය සියලුම දෙනා ලබා දෙන ලෙසත් දන්වන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියලුම ආයතන ප්‍රධානීන් |
| 5.2 | දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ වර්තමාන තත්ත්වය | ඩෙංගු රෝග ව්‍යාප්තිය ඉහල මට්ටමක පවතින බැවින් සියලුම දෙනා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. ජනවාරි මාසය තුළ පමණක් හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා රෝගීන් 111 වාර්තා වී ඇති බවත් වාරායන් ආශ්‍රිතව රෝගය පැතිරීමේ වැඩි ප්‍රවනතාවයක් දක්නට ලැබෙන බවත් දන්වන ලදි. | වරායන් පිරිසිදු කිරීම කඩිනම් කරන ලෙස හා අනෙකුත් ආයතන ද ඒ සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියලුම ආයතන ප්‍රධානීන් |
| **06** | **කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 6.1 | 2021/2022 මහ කන්නයේ වී වගාව සම්බන්ධ ප්‍රගතිය හා ගැටළු සහ යල කන්නය සම්බන්ධ ගැටළු | 4වන කන්නයේ මුං වගාව හෙක්ටයාර 3500ක සිදු කිරීමට නියමිත බවත්, එම බීජ අවශ්‍යතාවය සඳහා සැලසුම් සකස් කරමින් පවතින බවත් වාර්තා විය.<br>2021/22 මහ කන්නයේ අස්වනු නෙලීම වලව කලාපය ආශ්‍රිතව ආරම්භ වෙමින් පවතින බවත්, ගොවීන් රජය මගින් ලබා දෙන කාබනික පොහොරවලට අමතරව | වාර්තා ලබා දීමේ දී නිවැරදි වාර්තා ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | කෘෂිකර්ම අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඔවුන් ළග තිබූ රසායනික පොහොර දහාවිතා කරන බවට නිරීක්ෂණය වූ බව වාර්තා විය. | | |
| 6.2 | සීනික්කුව ප්‍රදේශයේ හේන් ගොවීන්ගේ ගැටළුව | සීනික්කුව ප්‍රදේශයේ හේන් ගොවීන් සඳහා වෙන් කළ ඉඩම් වන අලි කළමනාකාරණ කලාපයට අයත් වීම හේතුවෙන් හේන් ගෙවීන්ගේ ගොවිතැන් කටයුතුවලට බාධා එල්ල වී ඇති බව වාර්තා විය.<br>වන අලි කළමනාකරණ කලාපයේ ඉඩම් විදුලි වැටක් ඉදිකර හේන් ගොවීන්ට ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. එම ප්‍රදේශය බූන්දල රක්ෂිත මායිමේ ප්‍රවේශයක් වන බැවින් විදුලිවැට ඉදිකිරීමෙන් ප්‍රතිඵලයක් ලබා ගත නොහැකි බවට ද කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය කරුණු පිළිබඳව සොයා බලා ගොවීන්ට ද සාධාරණයක් වන පරිදි ඉදිරි කටයුතු කිරීම් සුදුසු බවට තීරණය කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ / නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| **07** | **නගර සංවර්ධන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 7.1 | සියක් නගර ව්‍යාපෘතියේ සහ අනෙතුක් ව්‍යාපෘතිවල 2021 වර්ෂයේ ප්‍රගතිය හා 2022 වර්ෂයේ සැලැස්ම ඉදිරිපත් කිරීම | සියක් නගර ව්‍යාපෘතියේ තවත් නගර 06ක වැඩ කොටස් ඉතිරි වී ඇති අතර එම කටයුතු ජනවාරි මාසයේ අවසන් කළ හැකි බව දන්වන ලදි. බැංකු චතුරස්‍රය සංවර්ධන කටයුතු විදුලි සැපයුම් හා ජල සැපයුම් ගැටළු හේතුවෙන් ප්‍රමාද වී ඇති බව දන්වන ලදි. | අදාල ආයතන සමග සම්බන්ධීකරණය වී පවතින ගැටළු නිරාකරණය කර සංවර්ධන කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.2 | තිස්සමහාරාම වැව යට පාරේ අනවසර ව්‍යාපාරික ස්ථාන ඉවත් කිරීමෙන් මතු වන ගැටළු | මාර්ග සංවර්ධන කටයුතු හේතුවෙන් තිස්සමහාරාම වැව යට පාරේ තාවකාලිකව ඉදිකරන ලද වෙළඳකුටි ඉවත් කරගන්නා ලෙස එම කඩහිමියන්ට දන්වා ඇති බවත්, එම හේතුවෙන් ඔවුන්ගේ ජීවිකාව අහිමි වී ගැටළුවලට මුහුණ පෑමට සිදුවන බවත් දන්වන ලදි.<br>ඒ අසල ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ මෙම කඩහිමියන් සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | අනවසර වෙළඳසැල් විධිමත්ව ඉවත්කරන තෙක් වෙළඳාම් කටයුතු සඳහා අවස්ථාව ලබා දෙන ලෙස දන්වන ලදි. | සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7.3 | අගුණකොළපැලැස්ස නගරයේ හුංගම මාර්ගයේ බස් රථ නවතන ස්ථානයේ ගැටළු | අගුණකොළපැලැස්ස මාර්ගයේ බස් රථය නතර කරන ස්ථානයේ මාර්ග තදබදයක් ඇති වීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අනෙකුත් ගමනාගමනයට බාධාවක් නොවන අයුරින් සුදුසු කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **08** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 8.1 | රතුකුරුස වැව වාරිමාර්ග දෙපාර්තමේන්තුව ට පවරා ගැනීම සම්බන්ධව කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | මෙම වැව මගින් කුඹුරු අක්කර 200ක් පමණ පෝෂණය වන බැවින් එම වැව වාර්මාර්ග දෙපාර්තමේන්තුවට පවරා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුනි. | අධ්‍යක්ෂ - වාරිමාර්ග දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ඉංජිනේරු - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 8.2 | තිස්ස වැව ආශ්‍රිතව සංචාරක කර්මාන්තයට බලපා ඇති ගැටළු | තිස්ස වැව තුළ බෝට්ටු සේවාව ක්‍රියාත්මක කරන බෝට්ටු හිමියන් විසින් බෝට්ටු නතර කිරීම වැව් බැම්ම දිගට සෑම ස්ථානයකම සිදු කිරීම හා බෝට්ටු ගැට ගැසීමේ දී වැව් බැම්ම ආරක්ෂාවට යොදා ඇති ගල් පෙට්ටිවලට (Gabion Box) වලට හානි සිදු වීම යන ගැටළු ඇති බවට කරුණු ඉදිරිපත් විය. | වැවේ ආරක්ෂාව සඳහා ජැටියක් යෙදීම සුදුසු බැවින් ඊට අදාල ව්‍යාපෘති වාර්තා වාරි මාර්ග දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි.<br>බෝට්ටු සංගමයේ සම්බන්ධීකරණය හා අධීක්ෂණය ප්‍රාදේශීය සභාව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කල යුතු අතර, අදාල නිර්නායක බෝට්ටු හිමියන් වෙත ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / අධ්‍යක්ෂ - වාර්මාර්ග / ප්‍රාදේශීය වාරිමාර් ඉංජිනේරු - තිස්සමහාරාමය |
| 8.3 | උඩුකිරිවැව ජලාශයේ මන්තීරු සංවර්ධනය හේතුවෙන් මතු වී ඇති ගැටළු | මන්තීරු සංවර්ධනය කිරීම සඳහා වැවේ ඇතුළතින් ගොඩකිරීම් සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. | වැව් බැම්මේ ශක්තිමත්භාවය පිළිබඳව ද අවධානය යොමු කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| **09** | **ජල සම්පාදන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 9.1 | රුහුණු රිදියගම ලියන්ගස්තොට ග්‍රාම නිලධාරී වසමේ පානීය ජල ගැටළුව | ජලය ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර මේ වන විට එම ගැටළුව විසඳී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට / ප්‍රාදේශීය කළමනාකරු - ජලසම්පාදන මණ්ඩලය |
| 9.2 | ප්‍රජා ජල දෙපාර්තමේන්තුව විසින් ජල සම්පාදන මණ්ඩලයට පවරණ ජල ව්‍යාපෘති සඳහා සමූපකාර | ප්‍රජා ජල ව්‍යාපෘති ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා දීමෙන් පසු එම ව්‍යාපෘතිවල දේපල, උපකරණ, සේවකයන් සහ අරමුදල් රටේ සංවර්ධනයට යොදා ගනිමින් විධිමත් ආර්ථික කටයුත්තකට යොමු කිරීම සඳහා ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචියට | ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍ය පහසුකම් ඉතිරිකරගෙන අනෙකුත් පහසුකම් වෙනත් ආර්ථික කටයුතු සඳහා ලබා දීමට කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල දෙපාර්තමේන්තුව / කළමනාකරු - ජලසම්පාදන මන්ඩලය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තු වේ ලියාපදිංචිය ලබා ගැනීම | අමතරව සමූපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි.<br>ඇතැම් ව්‍යාපෘතිවල ඇතැම් පහසුකම් ජලසම්පාදන මණ්ඩලයට උපකාරී වන බවට තොරතුරු ඉදිරිපත් විය. | | |
| 9.3 | බිංකම ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයේ පවතින ගැටළු | මෙම ජල යෝජනා ක්‍රමය අඟුණකොළපැලැස්ස ජල යෝජනා ක්‍රමයට එකතු කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>අමුද්‍රව්‍යවල හිඟතාවයක් හේතුවෙන් ඉදිකිරීම් කටුයුත ප්‍රමාද වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දෙන ලදී. | කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |
| **10** | **මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 10.1 | කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අවම කියුබ් 3 ධාරිතාවය සහිත බර වාහන ගමන් කළ හැකි මාර්ග සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීම | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලදී ප්‍රධාන මාර්ග දෙකක් සම්බන්ධ වන අතුරු මාර්ග සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුකරන අතර, එම මාර්ගවල විශාල වශයෙන් බර වාහන ගමන් කිරීම සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. එවැනි මාර්ග අවම කියුබ් 3 ධාරිතාවය සහිත වාහන ගමන් කිරීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් විය. | මාර්ග සංවර්ධනයේ දී ඊට අදාල නිර්නායක පිළිබඳව අවධානය යොමු කළ යුතු බවටත්, හඳුනාගෙන ඇති ගැටළු පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | සභාපති සූරියවැව ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - සූරියවැව /ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 10.2 | ශ්‍රී ලංගම හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් ඇතැම් බස් රථ සවස 4.30න් පසු පරිපාලන සංකීර්ණය අසලට නොපැමිණීම හේතුවෙන් ඇතිවන අපහසුතා | සවස 4.30න් පසුව ඇතැම් බස් රථ පරිපාලන සංකීර්ණය අසලට නොපැමිණීම හේතුවෙන් අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුතාවයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>ප්‍රාදේශීය සේවාවන් ගමන් කළ ද, අනන්තර් පළාත් සේවා බස් රථවල මෙම ගැටලුව පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>සැම්රන් හෝටලය අසල මාර්ගයෙන් බස් රථ ගමන් කිරීම වැළැක්විය යුතු බවට ද කරුණු ඉදිරිපත් විය. | අදාල කාලය තුළ සැම්රන් හෝටලය අසලින් බස් රථ ගමන් කිරීම වැලැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත්, ඒ සඳහා පොලීසියේ සහාය ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල / - දකුණු පළාත් අධ්‍යක්ෂ- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **11** | **වන ජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 11.1 | අධිවේගී මාර්ගය දෙපස අලිවැට ක්‍රියාත්මක නොවීමෙන් මතු වී ඇති ගැටළු හා වෙනත් ප්‍රදේශවල අලිවැට ක්‍රියාත්මක නොවීමෙන් මතු වී ඇති ගැටළු | සූරියවැව අන්තර් හුවමාරුවේ සිට අන්දරවැව අන්තර් හුවමාරුව දක්වා කොටසේ ස්ථාන කිහිපයකින් වන අලි අධිවේගී මාර්ගයට ඇතුළු වන බවටත්, ගම්වැසියන් කිහිපදෙනෙකු හිතා මතා වන අලින් මාර්ගයට යොමු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය සහාය පොලීසිය විසින් ලබා දිය යුතු බවත් තීරණය කරන ලදි. | ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල / ප්‍රධාන ඉංජිනේරු - දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව/ සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| 11.2 | බරවකුඹුක ප්‍රදේශයේ රිලවුන් හේතුවෙන් වගාවන්ට හානි සිදුවීම | බරවකුඹුක 07 කණුව ප්‍රදේශයේ වගාවන් රිලවුන් හේතුවෙන් විනාශ වන බවට කරුණු ඉදිරිපත් විය.<br>විවිධ ක්‍රම අනුගමනය කළ ද රිලවුන් පලවා හැරීමට නොහැකි බවට කරුණු ඉදිරිපත් විය. | ශබ්ද තරංග මඟින් කම්පනයක් ඇති කර රිලවුන් පලවා හැරීම සම්බන්ධයෙන් පර්යේෂණ අංශයට යොමු කොට විසඳුමක් ලබා ගැනීම සුදුසු බව තීරණය කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| 11.3 | සුචී ජාතික පාසලේ වන අලි ගැටළුව | සුචී ජාතික පාසල ආසන්නයේ අක්කර 25ක පමණ ප්‍රදේශයක් අධ්‍යාපන කටයුතු සඳහා වෙන් කර ඇති අතර, එම ප්‍රදේශය භාවිතයට නොගැනීම හේතුවෙන් වන ගහනය පවතින බවද, එම නිසා වන අලින් එහි රැඳී සිට රාත්‍රී කාලයේ පාසල් භූමියට ඇතුළු වන බවට කරුණු ඉදිරිපත් විය.<br>විදුලි වැටක් තිබුණද එය ක්‍රියාත්මක නොවන බවත් දිවා කාලයේ දී පාසලට අලින් ඇතුළුවීමේ අවධානමක් පවතින බවත් දන්වන ලදි.<br>පාසල පවත්වාගෙන යන කොටස වෙන් කර අනෙක් කොටස වෙනත් කටයුත්තක් සඳහා යොදා ගත හැකි බවට කරුණු ඉදිරිපත් විය. | ඉඩම නියමානුකූලව වෙන් කර ගන්නා ලෙසත්, පාසල පවත්වාගෙන යන කොටසේ විදුලි වැට ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවත් තීරණය කරන ලදි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| 11.4 | යාල වනෝද්‍යානයේ ගැටළු | වනෝද්‍යානය දිනකට පැය 2ක් පමණ වසා තැබීම හේතුවෙන් සංචාරකයන් අපහසුතාවයට පත් වී ඇති බවත්, වනෝද්‍යානය තුළ සංචාරකයන් ප්‍රවාහනය කරන සෆාරි ජීප් රථ රියදුරන්ගේ වැරදි සඳහා අදාල රථයත් සමඟම තහනම් කිරීම ගැටළු සහගත බවත් වාර්තා විය | වනෝද්‍යානය අදාල වේලාව තුළම විවෘතව තැබීමට උපදෙස් ලබා දුන් අතර, සංවර්ධනයට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන ලෙස ද උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ / උද්‍යාන පාලක - යාල ජාතික වනෝද්‍යානය |
| 11.5 | වල් සපුගල හේන් ගොවීන්ට ගොවි භූමි අහිමි වීමේ ගැටළුව | වල් සපුගල රක්ෂිතය සඳහා අක්කර 25ක් ගැසට් කිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ගොවිතැන් කළ ගොවීන්ට ගොවිතැන අහිමි වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. වන අලි | වන අලි කළමනාකරණ රක්ෂිතයේ මායිම මහවැලි අධිකාරිය සමඟ සම්බන්ධ වී නිරවුල් කර ගන්නා ලෙසත් ගොවීන්ට | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / තිස්සමහාරාමය / නේවාසික |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | රක්ෂිතයේ මායිම සම්බන්ධයෙන් ද ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ගොවිතැන් සඳහා අවස්ථාව ලබා දෙමින් සුදුසු කටයුතු සිදු කරන ලෙසත් දන්වන ලදි. | ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| **12** | **විදුලිබල ක්ෂේත්‍රෙය් ගැටළු** | | | |
| 12.1 | අම්බලන්තොට හාතගල ගල්මුල්ල ප්‍රදේශයේ කාපට් මාර්ගය ඔස්සේ විදුලි සැපයුම් මාර්ගය ඉදිකිරීම | හාතගල ගල්මුල්ල ප්‍රදේශයේ කාපට් කර සංවර්ධනය කර ඇති මාර්ගය ඔස්සේ මීටර 300ක් පමණ විදුලි සැපයුම් මාර්ගය දීර්ග කිරීමෙන් විදුලි පාරිභෝගිකයන් රැසකට විදුලිය ලබා ගත හැකි බවට කරුණු ඉදිරිපත් විය. | එම අවශ්‍යතාවය පිළිබඳව සලකා බලා විදුලි මාර්ගය දීර්ඝ කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | ප්‍රධාන විදුලි ඉංජිනේරු |
| 13 | **සීමා නිර්ණ ක්ෂේත්‍රෙය් ගැටළු** | | | |
| 13.1 | ඕකෙවෙල නව පොලිස් ස්ථානයට අයත් විය යුතු යෝජිත ග්‍රාම නිලධාරී වසම් සඳහා අනුමැතිය ලබා ගැනීම | ඕකෙවෙල පොලිස් ස්ථානය සඳහා ග්‍රාම නිලධාරී වසම් 10ක් යෝජනා වූ අතර ඒ සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලැබී ඇත. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල / බෙලිඅත්ත |
| 13.2 | මිද්දෙනිය නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඇති කිරීම හා ඊට අදාල වසම් නිර්ණය කර ගැනීම | මිද්දෙනිය නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4කින් පහත පරිදි වසම් වෙන් කර ගැනීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය.<br>වලස්මුල්ල - 5<br>වීරකැටිය - 9<br>අඟුණකොළපැලැස්ස - 11<br>කටුවන - 19 | දිස්ත්‍රික් සීමානිර්ණ කමිටුව රැස්වී නැවත සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් / අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් |
| **14** | **ඉඩම් ක්‍ෂේත්‍රයේ ගැටළු** | | | |
| 14.1 | හම්බන්තොට උඩ බැරගම ග්‍රාම නිලධාරී වසමේ සේවා පියසක් ඉදිකිරීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාල යට වෙන් කර ඇති ප්‍රයෝජනයට නොගත් බිම් කොටස ලබා | උඩ බැරගම ප්‍රදේශය සඳහා සේවා පියසක් නොමැති වීම හේතුවෙන් පොදු රැස්වීම් පැවැත්වීමට හා කොට්ටයාභයේ සේවය කරන නිලධාරීන්ට ස්ථිර ස්ථානයක් නොමැති වීම වැනි ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය. මේ සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති අතර දැනට හිස්ව ඇති පවුල් සෞඛ්‍ය කාර්යාලයට අයත් ඉඩමේ සේවා පියස ඉදිකිරීමට කමිටුවේ | අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බලා ඉඩම වෙන් කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ගැනීම | අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය.<br>සෞඛ්‍ය සේවකයන්ගේ නිල නිවාස සඳහා මෙම ඉඩම නම් කර ඇතත් මේ වන තෙක් පවරා දී නොමැති බවට කරුනු ඉදිරිපත් විය. | | |
| 14.2 | හම්බන්තොට මයුරපුර නිවාස යෝජනා ක්‍රමයේ ඉඩම්ලාභීන් සඳහා ඉඩම් තක්සේරු කිරීමේ දී මතු වී ඇති ගැටළු | 1995 ට පසු පදිංචිකරුවන් අනවසර පදිංචිකරුවන් සේ සලකා 03 වතාවක් ඉඩම් කච්චේරි පවත්වා නාම ලේඛන ප්‍රසිද්ධ කර තිබියදී වසර 10කට පමණ පසු නැවත ඉඩම් කච්චේරියක් මඟින් තක්සේරු කිරීම නිසා ඉඩම් හිමියන්ට විශාල මුදලක් ගෙවීමට සිදු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ඉඩම් අමාත්‍යාංශ ලේකම්ට හා ඉඩම් කොමසාරිස් ජනරාල්ට කරුණු ඉදිරිපත් කර පදිංචියට පැමිණි වර්ෂයේ සිට බදු අය කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | ප්‍රාදේශීය ලේකම්-හම්බන්තොට |
| 14.3 | වීරවිල නගරයේ කර්මාන්ත සඳහා වෙන් කර ඇති ඉඩම් ලබා ගැනීම | කර්මාන්ත හිමියන් සඳහා කර්මාන්ත ඉදිකිරීමට කිරිදි ඔය ව්‍යාපාරයෙන් මිනුම්කර බෙදා ඇති පර්චස් 40 බැගින් වූ ඉඩම් කැබලි මෝටර් රථ කර්මාන්තයේ නියැලෙන අය සඳහා ලබා දීමට ඉල්ලීම් ඉදිරිපත් විය.<br>එම ඉඩම් ටෙන්ඩර් පටිපාටිය අනුව ලබා දෙන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් උපදෙස් ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අදාල පාර්ශව වෙතින් ඉල්ලීම් ලිපි ලබාගෙන ඉදිරි කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් - හම්බන්තොට/<br>ප්‍රාදේශීය ලේකම්-තිස්සමහාරායය |
| 14.4 | පුද්ගලික කර්මාන්ත ශාලාවක් සඳහා ඉඩමක් ලබා ගැනීම | පොල්තෙල් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් සඳහා සුදුසු අක්කර 5ක පමණ ඉඩමක් ඉල්ලීම් කර ඇති බවට වාර්තා විය. | ව්‍යාපෘතිය අනුව ලබා දිය හැකි ප්‍රමාණය සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| **15** | **ධීවර ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 15.1 | කලමැටිය ප්‍රදේශය ආශ්‍රිතව ධීවර වරායක් ඇති කිරීම හේතුවෙන් ජීවිකාව අහිමි වූ මා දැල් ධීවරයන් සඳහා වන්දි මුදල් ලබා දීම සම්බන්ධ ගැටළු | කලමැටිය මාදැල් හිමිකරුවන් සඳහා රු. 5,000,000.00 බැගින් වන්දි මුදල් ලබා දී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය.<br>මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය හා අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී ඇති බැවින් මා දැල්වල සේවය කළ ගැනි කරුවන් සඳහා ද වන්දි මුදලක් ලබා දිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් විය. | ගැනි කරුවන්ට ද සාධාරණයක් වන පරිදි අදාල වන්දි මුදල් ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට/ ප්‍රාදේශීය ලේකම් - තංගල්ල / සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ධීවර කාර්යාලය |
| **16** | **වෙනත් ගැටළු** | | | |
| 16.1 | සී/ස හම්බන්තොට දිස්ත්‍රික් ව්‍යවසායකත්ව | මෙම සමිතියේ තැන්පත් මුදල් ලබා දෙන ලෙස තැන්පත්කරුවන් ඉල්ලීම් කළ ද මේ වන තෙක් අදාල මුදල් ලබා දී නොමැති බවත්, මේ | මේ සම්බන්ධ තොරතරු ඇතුලත් වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | සංවර්ධන සමිතියේ තැන්පත්කරුවන් මුහුණ පා ඇති ගැටළු | සම්බන්ධයෙන් සී/ස හම්බන්තොට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විමසීම් කළ ද මෙතෙක් ඊට පිළිතුරක් ලැබී නොමැති බවත් වාර්තා විය.<br>2013 වර්ෂයේ ආරම්භ කර ඇති මෙම සමිතිය 2014.03.31 වන තෙක් විගණන කටයුතු සිදු කර ඇති අතර, පසුව කාර්ය මණ්ඩලය විසින් විගණන ලේඛන ඉදිරිපත් කර නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | | |
| 16.2 | බහුකාර්ය බලකා සහායකයින් ස්ථිර කිරීම හා සේවා ස්ථානවලට අනුයුක්ත කිරීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග හා ගැටළු | හම්බන්තොට රෝහල සහ වාරි මාර්ග දෙපාර්තමේන්තුව සඳහා සේවක අවශ්‍යතාවයක් පවතින බවටත් ඉල්ලීම් කළද සේවකයන් මෙතෙක් ලැබී නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. මේ වන විට සේවක අතිරික්තයක් නොමැති අතර google sheet එකක් පුරවා නිසි ක්‍රමවේදයට අනුව ඉල්ලීම් ඉදිරිපත් විය යුතු බව දන්වන ලදි. | තවත් 60,000 ක් බඳවා ගැනීමට නියමිත බැවින් අදාල ඉල්ලීම් නිසි ක්‍රමවේදයට අනුව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන)/ සහකාර අධ්‍යක්ෂ - බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව / අදාල සියලුම ආයතන ප්‍රධානීන් |
| 16.3 | දිස්ත්‍රික් ලේකම් හා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින භාවිතා නොකරන නිල නිවාස සම්බන්ධ ගැටළු | දිස්ත්‍රික් ලේකම් හා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ භාවිතයට නොගන්නා නිල නිවාස 12ක් පමණ ඇති බවත් ඇතැම් ගොඩනැගිලි භාවිතයට ගත නොහැකි අයුරින් අබලන් වී ඇති බවත් වාර්තා වූ අතර, අවශ්‍ය ආයතන සඳහා එම ගොඩනැගිලි ගිවිසුම් ප්‍රකාරව මුදල් අයකර ලබා දීමට හැකියාව පවතින බව දන්වන ලදි. | අවශ්‍ය ආයතන විසින් අදාල ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / අදාල ආයතන ප්‍රධානීන් |

මහජන ශුභසිද්ධිය පිණිස කටයුතු කිරීම දේශපාලන අධිකාරියේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම වන බැවින් දෙපාර්ශවයම නම්‍යශීලීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. සියලුම ආයතන ප්‍රධානීන් රැස්වීම සඳහා සහභාගී විය යුතු බවත්, සහභාගී නොවන අය සඳහා ලිපි යොමු කරන ලෙසත් දැනුම් දුන් අතර, මෙම රැස්වීමේ දී ගනු ලැබූ තීරණ සම්බන්ධ ප්‍රගතිය ඊළඟ රැස්වීමේ දී සාකච්ඡා කරන බැවින් ඊට සූදානම් ව පැමිණෙන ලෙස දන්වා සිටින ලදි. අනතුරුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියලුම සාමාජිකයන් වෙත ස්තූතිය පලකරමින් ප.ව 1.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

**එච්.පී.සුමණසේකර**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය**

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2022 පෙබරවාරි මස ....08........ දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.